# 10 ප්‍රසාද ස්නාපනය

නිර්මලා : අන්න සීනුව නාද කරනවා. දැන් අපිට තියෙන්නේ ආගම නේ ද?

සිරිල් : ඔව්, අන්න ටීචර් එනවා.

ගුරුතුමියඃ ජේසු පිහිටයි!

සිසුහු : ජේසු පිහිටයි!

ගුරුතුමියඃ ළමයි, අපි ශුද්ධාත්මයාණන් වහන්සේට ගීතිකාවක් ගායනා කරමු. (සියලු දෙනා ම ගුරුතුමිය හා එක් ව "ශුද්ධාත්මෙනි" යන ගීතිකාව ගායනා කරති.)
කාට ද කියන්න පුළුවන් අපි කතෝලිකයන් වුණේ කොහොම ද කියලා?

නිර්මලා : ටීචර්, මම කියන්නම් අපි ඒ ගැන හයවන ශ්‍රේණියේදීත් ඉගෙන ගත්තා. අපි හැමෝ ම පොඩි කාලේ ප්‍රසාද ස්නාපනය ලැබුවා. ඒ නිසයි අපි කතෝලිකයෝ වුණේ.

සිරිල් : ටීචර් මාව ක්‍රිස්තියානි කරලා තියෙන්නේ පොඩි කාලේ. එදා ගත්ත ෆොටෝ, අපේ ගෙදර ඇල්බම් එකේ තියනවා.

ගුරුතුමිය :බොහෝම හොඳයි. අපි හැමෝම ප්‍රසාද ස්නාපනය ලැබූ නිසයි කතෝලිකයෝ වුණේ. මම අද පාඩමෙන් ඔයාලට කියලා දෙන්න යන්නේ ප්‍රසාද ස්නාපනය දානය කරන ආකාරය පිළිබඳව යි.

සිරිල් : ටීචර්, අපේ නංගී ව ක්‍රිස්තියානි කරනකොට මම දැක්කා, ෆාදර් නංගීගේ ඔළුවට ජලය වත්කරනවා.

ගුරුතුමියඃ පුතාගේ මතකය බොහෝ ම හොඳයි. මම අද ඒවා විස්තර ඇති ව කියලා දෙන්නම්. ප්‍රසාද ස්නාපනය දානය කරන කොට ජලය පාස්කු ඉටිපහන, සුදු වස්ත්‍ර, ශුද්ධ වූ තෛලය ආදිය භාවිත කරනවා. ඔයාලා හයවන ශ්‍රේණියේ දහවන පාඩමෙන් ඒ පින්තූර දැක්කා නේ ද?

නිර්මලා : ඔව් ටීචර්, අපි දැක්කා.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ගුරුතුමිය: ප්‍රසාද ස්නාපනය දනය කරන කොට අනුපිළිවෙළක් තියෙනවා.

පැට්‍රික් : කොහෙද ටීචර් ඒ අනුපිළිවෙළ ලියවිලා තියෙන්නේ?

ගුරුතුමිය: ඔයලා දකලා තියනවා නේද, අපේ පූජාප්‍රසාදින් වහන්සේලා විවිධ ආශිර්වාදයන් දනය කරනකොට භාවිත කරන පොත? ඒ පොතේ තමයි ඒ පිළිවෙත තියෙන්නේ. ඒ පොතට කියන නම "සරල පිළිවෙත් සංග්‍රහය"

## ප්‍රසාද ස්නාපන පිළිවෙත



10.1 - ප්‍රසාද ස්නාපන පිළිවෙත් කිහිපයක්

- ත්‍රිත්ව ස්තෝත්‍ර යැදුමින් ආරම්භ කිරීම
- දරුවාට දෙන (ක්‍රිස්තියානි) නම විමසීම
- දෙමව්පියන් හා ආත්මික මව්පියන් වෙත ඔවුන්ගේ වගකීම් පැවරීම
- ළදරුවාගේ නළලේ පූජාප්‍රසාදිතුමා (දෙමව්පියන් හා ආත්මික මව්පියන්) කුරුසියේ ලකුණ සලකුණු කිරීම : මෙයින් ක්‍රිස්තුන් වන්සේ කුරුසිය මගින් දිනා දුන් ගැලවීම සංකේතවත් කෙරේ.
- දේව වාක්‍ය පිළිවෙත හා විශ්වාසකයින්ගේ යාච්ඤා : කිතුනු විශ්වාසයට පිළිතුරු දීම සඳහා දේව වචනයට සවන් දෙන්නා අලෝකවත් කරනු ලබයි.
- සාන්තුවර පිහිට අයැදීම
- දුෂ්ටාත්ම දුරු කිරීමේ යැදුම : මෙයින් පාපය හා යක්ෂයා පරාජය කිරීම සංකේවත් කෙරේ.
- ප්‍රසාද ස්නාපන පූර්ව ආලේපය (oc)
- දරුවාගේ හිස මත අත් තබා යැදීම
- ප්‍රසාද ස්නාපන පොරොන්දු දීම : යක්ෂයා ප්‍රතික්ෂේප කර ත්‍රිත්වික දෙවියන් වහන්සේ ව විශ්වාස කරන බවට දරුවා වෙනුවෙන් දෙමාපියෝ හා ආත්මික මව්පියෝ පොරොන්දු වෙති.
- හිසමත ජලය වත්කරමින් ප්‍රසාද ස්නාපනය කිරීම : ප්‍රසාද ස්නාපනයේ දී අත්‍යවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත වන්නේ මෙය යි. එනම්, "........ (නම) පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබ බෞතීස්ම ස්නාපනය කරමි" යයි කියමින් පූජාප්‍රසාදිතුමා දරුවාගේ හිස මතට ජලය වත්කරයි. මෙම පිළිවෙත මගින් දරුවා ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්මය ලබයි.
- ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම (sc) : පූජාප්‍රසාදිවරයකු, දිවැසිවරයකු හා රජ කෙනකු ලෙස ප්‍රසාද ස්නාපනය ලැබූ දරුවා ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරනු ලබයි.
- සුදු වස්ත්‍රය පැළඳවීම : ප්‍රසාද ස්නාපනය ලබන දරුවා ක්‍රිස්තුන් වහන්සේ ව පැළඳ ගැනීම මේ තුළින් සංකේවත් කරයි.
- පාස්කු ඉටිපහනින් ඉටිපහන් දල්වා ගැනීම : දරුවා ක්‍රිස්තුන් වහන්සේ විසින් ආලෝකවත් කරනු ලැබීම සංකේවත් කරයි. එබැවින් දරුවා ලෝකය තුළ ආලෝකයේ දරුවකු මෙන් ජීවත් විය යුතු වෙයි.
- මව සහ පියා අශිර්වාද කරනු ලැබීම
- අවසාන පොදු ආශිර්වාදය.

## ප්‍රසාද ස්නාපනය පිළිබඳ ශාසන නීතිය

ප්‍රසාද ස්නාපනය හා සම්බන්ධ නීති කිහිපයක් ශාසන නීති සංග්‍රහයේ දක්වා ඇත. ඒ අනුව;

- දරුවා අයත් දේවස්ථානයෙහි ප්‍රසාද ස්නාපනය කළ යුතු ය.
- මීසමෙන් බැහැර ස්ථානයක දී ප්‍රසාද ස්නාපනය ලබන්නේ නම් සාධාරණ හේතුවක් තිබිය යුතු ය.
- දරුවා උපත ලද පළමු සති කිහිපය තුළ ප්‍රසාද ස්නාපනය කළ යුතු ය.
- දරුවාට ප්‍රසාද ස්නාපනය ලබා දීමට දෙමාපියන් නිසි ලෙස සූදනම් විය යුතු ය. උදහරණ:- මීසම් භාර පියතුමා කල් ඇතුව දනුවත් කර අවශ්‍ය උපදෙස් ලබා ගැනීම; ඔවුන් ද ආධ්‍යාත්මිකව ඊට සූදනම් විය යුතු වේ.
- මරණාසන්න දරුවනට හැකි ඉක්මනින් ප්‍රසාද ස්නාපනය ලබා දිය යුතු ය.
- ළදරුවකු ප්‍රසාද ස්නාපනය කිරීමට දෙමව්පියන් දෙදෙනාගෙන් එක් කෙනකු හෝ නීත්‍යනුකූල භාරකරුවා හෝ කැමැත්ත දිය යුතු අතර එම දරුවා කතෝලික විශ්වාසය තුළ ඇති දැඩි කරන බවට ඔවුහු මීසමේ පියතුමාට සහතික විය යුතු ය.
- මරණාසන්න පුද්ගලයෙක් ප්‍රසාද ස්නාපනය ලබන්නේ නම් කිතු දහමේ අපේක්ෂාවනට අනුව ජීවත් වන බවට පොරොන්දු විය යුතු ය.

### ක්‍රියාකාරකම

1. ප්‍රසාද ස්නාපන පිළිවෙතෙහි වැදගත් ම අවස්ථාව කුමක් ද?
2. පාස්කු ඉටිපහනින් ඉටිපහන් දල්වා ගැනීමේ අර්ථය ලියන්න.
3. ප්‍රසාද ස්නාපනයේ වැදගත් අවස්ථා චිත්‍රවලට නඟා ඒවා පිළිවෙළට අලවා පොත් පිංචක් සාදන්න.



**ජීවිතයට බිඳක්**

***ප්‍රසාද ස්නාපනය දනය කරන පිළිවෙත හොඳින් නිරීක්ෂණය කර ඒ පිළිබඳ ව මීසමේ පියතුමාගෙන් විමසා දැනුවත් වන්න.***